# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,143 — 1960 ජූනි 10 වැනි සිකුරාද — 10.6.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයක් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 109 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | 115 |
| තනතුරු—ඇබෑර්තු ... ... | 109 | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 112 | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවසාථා ... ... | 114 | මාගී කොම්පි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 116 |


## පළාත් පාලන නිවේදන

### සුසාන භූමි හා භූමදාන කිරීම පිළිබඳ ආඥාපනත

1947 තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත සුසාන භූමි හා භූමදාන කිරීම් පිළිබඳ ආඥාපනතේ (181 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා විසින්, නියමිත බල මණ්ඩලයේ, එනම්, හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම් ප්‍රදේශයේ ගම්කායභී සභාවේ නිර්දේශය පිට, මීට යාකොට ඇති, උපලේඛනයේ විස්තර කරනු ලබන ඉඩමේ භූමදාන කරන සථානයක් පිහිටුවීමේ කාරණය සඳහා ද, එම ඉඩම, වැලිපැන්නාගහ මුල්ලේ, හෙවන වත්තේ, එම්මැනුවල් වීරසූරිය මහතා විසින් හා ඔහු ගේ පවුලේ අය විසින් ද භූමදාන කරන සථානයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා ද අනුමත කරන්ට යෙදුන බව මෙයින් දන්වා සිටිමි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කායභාංශයේ සථාවර ලේකම් තැන.

වර්ෂ 1960 මැයි මස 26 වැනි දින,
කොළඹ, පළාත් පාලන කායභාලයේ දීය.

#### උපලේඛනය

වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ යටකලන් පත්තුවේ හෙවණ ග්‍රාමයේ පිහිටි හෙවණ වත්ත නමැති ඉඩමෙන් අක්කර 25 රූඩ් 3 ක ප්‍රමාණය අඩංගු වූ, බලයලත් මිනින්දෝරු තැන්පත් ඩබ්ලිව්. ආර්. ඇස්. ප්‍රනාන්දු මහතා විසින් සම්පාදිත 1957 තේ අප්‍රේල් මස 23 වැනි දින අංක 1,102 දරණ පිඹුරේ ඒ2 අක්ෂරය දරණ කැබැල්ල වශයෙන් තවදුරටත් විශේෂ යෙන් විස්තර කරන පහත සඳහන් මායිම් වලින් යුක්තවූ ඉඩම් කොටසක්, එනම් :—

උතුරට: යටකලන් වතුගහ මුල්ල පාර වශයෙන් හඳුන් වනු තොලෑබේ නම්, ගම් සභා පාරෙන් ද; දකුණට: එම්මැනුවල් වීරසූරිය මහතාට අයිතිවූ හෙවණ වත්තේ 1,102 දරණ එකී පිඹුරේ "ඒ" අක්ෂරය දරණ කැබැල්ල වශයෙන් පෙන්නුම් කර තිබෙන්නාවූ කොටසින් ද; බටහිරට: එම්මැනුවල් වීරසූරිය මහතාට අයිති හෙවණ වත්තේ 1,102 දරණ එකී පිඹුරේ "ඒ3" අක්ෂරය දරණ කැබැල්ල වශයෙන් පෙන්නුම් කර තිබෙන්නාවූ කැබැල්ලේ මායිම ඔස්සේ වැටෙන පාරෙන් ද වේ.

---

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාව කාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවසථාවන්හි දී, ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥාපනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥාපනත පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධන වලට ද ඒ ආඥාපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරු ද ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්‍ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සවකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්‍ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම දෙවර්ෂයක ආධුනික කාලයකට හෝ දෙවර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් සවකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. නව ප්‍රවේශක නිලධාරීහු.—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්‍ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැතිනම්, අවුරුදු 2ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, විශේෂයෙන් ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් මෙතෙක් සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ට" නියම කරනු ලැබෙයි.

(iii) (අ) සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්‍ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ඔවුන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්‍ෂා කාලය අවසානයේදී තනතුරුවල ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයකින් සමත්වීම උඩ රඳා පවතී.

සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්‍ෂා කාලය ඇතුළතදී සිංහල භාෂා ප්‍රවීණත්වයෙහි ලා නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වන නිලධාරීන්ගේ සේවය නැවැත්විය හැකිය. එහෙත්, රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලැබීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත් විය හැකි නම් එසේ සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසු සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළතදී නිලධාරියා පරීක්‍ෂණයෙන් සමත් වුවහොත්, කොමිෂන් සභාවේ අභිමතය පරිදි, ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් වූ පාඩුව නොසලකා හැරිය හැකිය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්‍ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්‍ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. යුද්ධ සේවා අනුග්‍රහය.—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්‍ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

9. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බල මණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරිමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් සවකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්‍ෂණයක් හෝ ලිඛිත පරීක්‍ෂණයන් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්‍ෂක යන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්‍ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්‍ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්‍ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්‍ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්‍ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නො ලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරට අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම් පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියළුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) උප්පැන්න සහතිකය, (2) ඉංග්‍රීසි/සිංහල/දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (3) චරිත සහතිකය, (4) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වේ නම් වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 9 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

——————— තනතුරු සඳහා වූ අයදුම් පතයි (——)

1. පුරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරින් :————.

ජාතිය :————.

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න).

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු————, මාස————, දින————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත්වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන (තනතුරු, පළාත් පාලනායතන හා කාලසීමාවන්) : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිත ද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණු දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද ? :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දිනා වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැදීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වූවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### දෙවැනි ශ්‍රේණියේ කම්බිකරු තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරාගනුලැබූ අයදුම් කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුත්තාහ. ඔවුන් පත්කරනු ලබන පළාත් පාලන ආයතනයේ නාගරික සීමාව ඇතුලත පදිංචිවන ලෙස ද ඔවුන්ට නියම කරනු ලැබේ. මහපත්තු, අඹගමුව, කොකුවිල් හා වත්තාලෙයි යන ගම්කාර්ය සභාවල හා පානදුර පලාත් ආණ්ඩු සභාවෙහිද දැනට පුරප්පාඩු ඇත.

2. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 666—16×12—රු. 1,338. රු. 1,086 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම.

3. අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතු අතර, 60. 6. 24 දිනට වයස අවුරුදු 40 කට නොවැඩි විය යුතුයි. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන් එකක් ලියන්නට හා කියවන්නට හැකි විය යුතුයි. අතිශක්මතා (H.T.) අවශක්මතා (L.T.) ගොඩනැංවීමෙහි හා නඩත්තු කරගන යාමෙහිත්, පොළොව යට හා උඩින් පිහිටි විදුලිය කම්බි, විදුලිය බෙදා හැරීමේ කම්බි, නිවාස වලට විදුලිය සැපයීමේ වැඩ පිළිබඳවත් යටත් පිරිසෙයින් අවුරුදු 7ක පළපුරුද්දක් තිබිය යුතුයි. විදුලි බලය පිහිටවූ තැන් පරීක්ෂා කිරීමට හා මීටර් කියවීමට හැකි විය යුතු අතර උඩින් කම්බි ඇදීමේ වැඩ සම්බන්ධ රෙගුලාසි හා ආරක්ෂාව පිළිබඳ නීතිරීතිත් හොඳින් දැන සිටිය යුතුයි. එසේම අයි. ඊ. ඊ. රෙගුලාසි පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් තිබිය යුතුයි.

4. පළාත් පාලනායතනයක සථිර සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍ර, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ. එහෙත් එසේ කරන්නේ ඔවුන් අනික් සුදුසුකම් ලබා සිටියොත් පමණි. එවැනි අයදුම් කරුවන්ගේ අයදුම් පත්‍ර තමා සේවය කරන පළාත් පාලනායතනයේ නගරාධිපතිතුමා හෝ සභාපතිතුමා මඟින් ඉදිරිපත් කළ යුතුය. යුද්ධ සේවයේ යෙදී සිටි අයදුම්කරුවන්ගේ යුද්ධ සේවා කාලය වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා තමා විසින් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 60. 6. 24 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ **පෞද්ගලික නමට නොවේ.**

වී. සී. ජයසූරිය,  
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ  
වැඩ බලන සභාපති.

1960 ජූනි 3 වැනිදා,  
තැ. පෙ. 530,  
කොළඹ.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### ගම්සභා ලිපිකරු සේවයට බඳවා ගැනීමේ විභාගය— 1960 සැප්තැම්බර් 17

(අ) **විභාගය පවත්වන දින.**—ගම්සභා ලිපිකරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගයක්, පුරුෂ පක්ෂයේ අපේක්ෂකයින් සඳහා කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය සහ මඩකලපුව යන මධ්‍යස්ථානයන්හි 1960 සැප්තැම්බර් 17 වැනි දින පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස්වරයා විසිනි.

(ආ) තමා තෝරා ගන්නා ලද පළමුවෙනි සහ දෙවෙනි විභාග මධ්‍යස්ථානයන්, ඉල්ලුම් පත්‍රයේ 5 වෙනි කොටුවෙහි පිළිවෙලින් දැක්විය යුතුයි. යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා සෑහෙන අපේක්ෂකයින් ගණනක් ඇතුළු නොවුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කරනවා ඇත.

(ඇ) විභාග මධ්‍යස්ථානයක් මාරුකිරීමට කිසිම හේතුවක් උඩ ඉඩ දෙනු නොලැබේ.

2. (i) **වැටුප් ක්‍රමය.**—සමත්වන අයදුම්කරුවන්, රුපියල් 1,608 ට පෙර කාර්යක්ෂමතා කඩයිමක් සහිත වූ රුපියල් 888න් පටන් ගෙන රුපියල් 72 බැගින් රුපියල් 2,184 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් ක්‍රමයක් හිමි, ගම්කාර්ය සභා ලිපිකරු සේවයේ පුරප්පාඩු ඇතිවන පරිදි පත්කරනු ලැබේ. රජයේ ප්‍රමාණයන්ට හා නියමයන්ට අනුව ගෙවල් කුලී දීමනා, තාවකාලික ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනාද ගෙවනු ලැබේ.

(ii) **සේවා කොන්දේසි.**—

(අ) මෙම සේවයේ තනතුරු සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අපේක්ෂකයෝ, පළාත් පාලන සේවයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රයෝජන ලැබීමට සුදුස්සෝ වෙති.

(ආ) නිවාඩුදීම් හා අනිකුත් සේවා කොන්දේසි, 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන හා ඒ යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලට සහ ගම්කාර්ය සභා ආඥාපනත යටතේ සම්පාදිත ගම්කාර්ය සභා අතුරු ව්‍යවස්ථා හා ගම්කාර්ය සභා රෙගුලාසිවලට අනුව නිගමනය කෙරෙයි.

(ඇ) සමත්වන අයදුම්කරුවන් අවුරුදු 2ක ආධුනික සේවා කාලයක් යටතේ පත්කරනු ලැබේ. ඔව්හු, 1946, අංක 5 දරන පළාත් පාලන (සංක්‍රමණ විධිවිධාන) ආඥාපනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන ආඥාපනතට හා ඒ පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධනවලට හා එම ආඥාපනත යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලටද යටත් වෙති.

3. සමත්වන අයදුම්කරුවන්ගේ නාමයන්, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ පළකරනු ලබන්නේය. පුරප්පාඩු ඇතිවන පරිදි ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

4. (i) අපේක්ෂකයින් යහපත් චරිතයෙන් යුක්ත විය යුතුයි.

(ii) අපේක්ෂකයින් ලාංකිකයින් විය යුතුයි. *

(iii) අපේක්ෂකයින් යටත් පිරිසෙයින්—

(අ) ඉංග්‍රීසි විෂයයක් වශයෙන් ගෙන, සිංහල හෝ දෙමළ හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ආ) ඉංග්‍රීසි 6 වැනි පංතියෙන් සහ සිංහල හෝ දෙමළ හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වූවන් හෝ විය යුතුය.

**සංලක්ෂ්‍යය.**—කිසියම් අයදුම්කරුවකු ඉහත සඳහන් විභාග අතුරෙන් කිසිවකට පෙනී සිට, මෙම විභාගයට ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය වනතුරුත් එකී විභාගයේ ප්‍රතිඵල නිකුත් වී නැතිනම් එවැනි අයගේ ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

(iv) අපේක්ෂකයින් 1960 සැප්තැම්බර් 17 වැනි දිනට වයසින් අවුරුදු 17 කට නොඅඩු වූත් අවුරුදු 25 කට නොවැඩි වූත් අය විය යුතුයි. යුද්ධ සේවයේ සිටි අයදුම්කරුවන්ට තමන් පසුගිය යුද්ධයේදී ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි කාලය තම වයසින් අඩුකර ගත හැක.

අයදුම්කරුවෝ යටත් පිරිසෙයින් 1960 ජූනි 10 වැනි දිනට එක්කම ඊට පළමු 3 අවුරුදු කාල පරිච්ඡේදයක් තුළ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ දෙවැනි උපලේඛනයෙහි සඳහන් කොට ඇති ප්‍රදේශයක් තුළ පදිංචි වී සිටිය යුත්තාහ.

5. **සුදුසුකම්.**—දැනට පළාත් පාලන සේවයේ නියුක්ත අයට දෙනු ලබන විශේෂ අනුග්‍රහය—

1960 ජූනි 30 වැනි දිනට ප්‍රථම අවුරුදු 5කට නොඅඩු කාලයක් පළාත් පාලන බලමණ්ඩලවල සථිර සේවයේ නියුක්ත අපේක්ෂකයින්ට අධ්‍යාපන සුදුසුකම් තිබේ නම්, වයස සීමාවක් නොමැතිව මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

6. **අයදුම් පත්.**—(i) විභාගයට ඇතුළත්වීමේ අයදුම් පත්‍ර, කොළඹ, කොටුවේ, ගෆ්පූර් ගොඩනැගිල්ලේ, පළමුවැනි තට්ටුවේ, අංක 29 1/5 දරණ කාමරයේ පිහිටි පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයයෙන්, 1960 ජූනි 15 වැනි දින සිට එම මස 25 වැනි දින දක්වා ලබාගත හැක.

විභාගයට ඇතුළත්වීමේ අයදුම් පත්‍ර තැපැල් මගින් ඉල්ලා සිටින අපේක්ෂකයින් සිය ලිපිනය ලියූ ලියුම් කවරයක් සමග එසේ කළ යුතුය. එම ලියුම් කවරයේ වම් පස මුදුනේ විභාගයේ නම පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි. එසේ කිරීමෙන් අපේක්ෂකයා වෙත අයදුම් පත් කඩිනමින් තැපැල් කිරීමට හැකි වෙනවා ඇත.

(ii) අයදුම් පත් 1960 ජූනි 30 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලියුම් කවරයේ වම් පස මුදුනේ විභාගයේ නම පැහැදිලිව ලියා තිබිය යුතුයි.

(iii) අයදුම් පත්‍රවල රුපියල් 3.00ක විටිනාකම ඇති මුද්දර අලවා යථා පරිදි අවලංගු කොට තිබිය යුතුයි.

(v) දැනට රජයේ හෝ පළාත් පාලන බලමණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්, සිය අයදුම් පත්‍ර එවිය යුත්තේ, තමන් දැනට සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ පළාත් පාලන බලමණ්ඩලයේ නාගරික කොමසාරිස්වරයා/විශේෂ කොමසාරිස්වරයා/සභාපතිවරයා මාර්ගයෙනි. මෙසේ කිරීමට යම් අයදුම්කරුවකු අපොහොසත් වුවහොත් ඔහු විභාගයට නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ. 1960 ජූනි 30 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත ලැබෙන සේ සිය අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත හෝ පළාත් පාලන බලමණ්ඩලවල ප්‍රධානීන් වෙත, සිය අයදුම් පත් කල් වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) අයදුම් පත්‍රයත් සමග පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුයි. අයදුම්කරු, 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ දෙවැනි උප ලේඛනයෙහි සඳහන් කොට ඇති ප්‍රදේශයක,† 1960 ජූනි 10 වැනි දිනට ප්‍රථම යටත් පිරිසෙයින් අවුරුදු 3ක කාලයක් පදිංචිව සිටි බවට දිස්ත්‍රික් ආදායම් නිලධාරියෙකුගෙන්, සමාදාන විනිශ්චයකාරයෙකුගෙන්, අධිනීතිඥයකුගෙන්, නීතිඥයකුගෙන් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකුගෙන් ලබාගත් සහතිකයක් ඉල්ලුම් පත්‍රයට අමුනා තිබිය යුතුයි.

(ii) ඉහතින් දැක්වූ (i) යන අනු ඡේදයෙහි දැක්වූ සහතික පත් හැර වෙන කිසිම ලියවිලි ආදියක් අයදුම් පතට අමුනා නොතිබිය යුතුයි. එහෙත් වුවමනා කරුණු සියල්ලම අයදුම් පතෙහි සඳහන් කළ යුතුයි.

(iii) විභාගයේදී සමර්ථතාවයක් දැක්වූවන් විසින් විභාගයට පෙනී සිටීමට ඔවුන්ගේ සුදුසුකම් ලියකියවිලි වලින් ඔප්පු කළ යුතුයි. ඔවුන් එම ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාදව ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

(iv) පහත සඳහන් ලියවිලි අවශ්‍ය වෙනවා ඇත :—

(අ) 1935 සැප්තැම්බර් මස 17 වැනි දිනට ප්‍රථම නොවූත්, 1943 සැප්තැම්බර් මස 17 වැනි දිනට පසුව නොවූත් දිනක උපන් බවට අපේක්ෂකයාගේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක්. (පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික පත්‍ර හෝ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙන් උපුටාගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නොලැබේ.)

(ආ) පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමාට ඒත්තු ගත හැකි, යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්. අයදුම්කරු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක අධ්‍යාපනය ලැබුවෙක් නම්, ඔහු අන්තිමට ඉගෙනුම ලැබූ රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවේ හෝ ප්‍රධානාචාර්යවරයාගෙන් ලැබූ චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ නොමැති නම්, කැමති පරිදි, අයදුම් කරුගේ ගුරුවරයාගෙන් හෝ, පාඨශාලාචාර්යවරයාගෙන් හෝ ප්‍රසිද්ධ නිලධාරියෙකුගෙන් හෝ සමාදාන විනිශ්චයකාරයෙකුගෙන් හෝ අධිනීතිඥයකුගෙන් හෝ නීතිඥයකුගෙන් හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුගෙන් හෝ සාමාන්‍ය වශයෙන් ඒ පිළිබඳව කරුණු සොයා බැලිය හැකි ප්‍රසිද්ධ පුද්ගලයෙකුගෙන් ලබාගත් චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

(ඇ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතික පත්‍ර.

(ඈ) හඳුනා ගැනීමේ පත්‍රය.

(v) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේදී වුවමනා සියලුම ලියකියවිලි සූදානම්ව තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කරන්නට අපොහොසත් වන හෝ පළාත් පාලන කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් ඉල්ලා සිටි විටෙක ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාදවන හෝ අපේක්ෂකයන්ගේ ඇතුළත්වීම අවලංගු කරනවා ඇත.

**සැළකිය යුතුයි :—**

(අ) නියමිත ආකෘති පත්‍රයෙහි නොලියන ලද අයදුම් පත්‍ර භාරගනු නොලැබේ.

(ආ) මෙම විභාගයේ නීතිරීතිවලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

8. විභාගයට ඇතුළත් කර ගැනීම :—පිළිගනු ලැබූ අයදුම් පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයන් විභාගයට පෙනී සිටීම ප්‍රතික්ෂෙප කරනු ඇත.

අයදුම්කරුවන් තමනට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

ප්‍රවේශ පත්‍රයක් සමග කාල සටහන් පිටපතක් හා අයදුම්කරුවන්ට මග පෙන්වීම සඳහා විභාග කොමසාරිස්වරයා විසින් සම්පාදිත ව්‍යවස්ථා මාලාවක්ද එවනු ලැබේ. මෙම ව්‍යවස්ථාවන් අනුව අපේක්ෂකයන් බැඳී සිටිනු ලබන්නාහ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයෙහිදී සවකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට භාරදිය යුතුයි.

විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු සවකීය ප්‍රවේශ පත්‍රය් නොලැබුනහොත් ඒ බව වහාම—

"පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති,
තැ. පෙ. 530,
කොළඹ".

යන ලිපිනයට දැනුම්දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම පහත සඳහන් තොරතුරුද සැපයිය යුතුයි.

1. විභාගයේ නම :————.

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

3. සම්පූර්ණ ලිපිනය :————.

4. අපේක්ෂකයා විසින් ඉල්ලුම් කර ඇති විභාග මධ්‍යස්ථානය : ————.

**සැළකිය යුතුයි :**—විභාගයට ඇතුළත් කර ගැනීම ඊට සුදුසුකම පිළිගැනීමක් හැටියට සළකනු නොලැබේ.

9. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

10. අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි තොරතුරක් ඔවුන් දැනුවත්වම අසත්‍ය බව පෙනී ගියහොත්, ඔවුන්ට පත්වීම් දෙනු ලැබුවත් සේවයෙන් පහකරන්නට පිළිවන. සිතාමතාම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත් ඒ සමානම දඬුවම් ලැබීමට පිළිවන.

11. මුදල් ආපසු දීම :—කවර කරුණක් නිසාවත් මුද්දර ගාස්තු ආපසු දෙනු නොලැබේ.

12. විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු :—සවකීය දෙපාර්තමේන්තුවල හෝ පළාත් පාලන ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කරන, පිළිගන්නා ලද අයදුම් පත්‍ර හිමි නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරී නිවාඩු දෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් හා පළාත් පාලන බලමණ්ඩලවල සභාපතිවරුන්ගෙන්, විශේෂ කොමසාරිස්වරුන්ගෙන් හා කොමසාරිස්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

13. හඳුනා ගැනීමේ පත් :—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ.

(අ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්.

(ආ) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්.

(ඇ) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

ප්‍රවේශ පත්‍රයක් සමග ඉහත සඳහන් ලියවිලි වලින් එකක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන කිසිම අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

14. **විභාග පරිපාටිය.**—විභාගය පවත්වනු ලබන්නේ කොටස් දෙකක් වශයෙනි. එනම් I වැනි කොටස (ලිඛිත) විභාගය සහ II වැනි කොටස (සම්මුඛ පරීක්ෂණය). පහත සඳහන් වන්නේ විභාගය සඳහා ඇති විෂයයන් සහ එක එක විෂයයන් වෙනුවෙන් නියමිත ලකුණුත් ය. අශෝභන අත් අකුරු ගැන හා අක්ෂර වින්‍යාසයේ වැරදි ගැනද සියලුම ලිඛිත උත්තර පත්‍ර වලින් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි ලෙස අකුරු ලියන ලද විභාගාපේක්ෂකයින් නුසුදුසු බවට පත්වීමට ඉඩ තිබේ.

(අ) පළමුවන කොටස (ලිඛිත විභාගය) :—

| විෂයයෝ | ලකුණු |
|---|---|
| (i) ඉංග්‍රීසි භාෂාව හා වාක්‍ය රචනය ... ... | 150 |
| (වාක්‍ය රචනයක්, සාරාංශය සහ ඉංග්‍රීසි භාෂාවේ නිවැරදි භාවිතය පරීක්ෂාකිරීම සඳහා ප්‍රශ්නත් ඇතුළු පැය එකහමාරක ප්‍රශ්න පත්‍රයකි). | |
| (ii) බුද්ධි පරීක්ෂණය ... ... ... | 100 |
| (iii) පහත සඳහන් දෙකින් එකක් :— | |
| සිංහල හෝ දෙමළ ... ... ... | 200 |
| (වාක්‍ය රචනයක්, සාරාංශයක් සහ භාෂාවේ නිවැරදි භාවිතය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්නත් ඇතුළු පැය 2ක ප්‍රශ්න පත්‍රයකි. සිංහල අයදුම්කරුවන් විසින් සිංහලද, දෙමළ අයදුම්කරුවන් විසින් දෙමළද ගත යුතුයි. | |

(ආ) දෙවැනි කොටස :—

| | |
|---|---|
| සම්මුඛ පරීක්ෂණය ... ... ... | 100 |
| (මෙම නිවේදනයේ 7 වැනි ඡේදයේ iv වැනි කොටසේ සඳහන් සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි.) | |

ලිඛිත විභාගය පළමු කොට පවත්වනු ලැබේ. එහි ප්‍රතිඵල අනුව, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව නිශ්චය කරනු ලබන්නේ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසිනි.

15. සමත්වන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම කොටසක සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය බව සනාථ කිරීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ වැඩ බලන සභාපති.

1960 ජූනි 3 වැනිදා,
තැ. පෙ. 530,
කොළඹ.

---

සැ. යු.—විභාගය පිළිබඳ කිසිම ලිපියක් සභාපතිවරයාගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

*පළාත් පාලන සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම "ලාංකික" යන පදයෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන් ය.

† 1945 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ දෙවැනි උපලේඛනයෙහි නියමිත ප්‍රදේශ තුන පහත සඳහන් පිළිවෙල අනුව වේ.

"ඒ" ප්‍රදේශය—කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ උඩප්පු ගම් ප්‍රදේශය හැර හලාවත යන ආදායම් දිස්ත්‍රික්ක.

"බී" ප්‍රදේශය—උතුරු මැද පළාත, ඌව පළාත, මහනුවර, මාතලේ, නුවරඑළිය, රත්නපුර, කෑගල්ල සහ කුරුණෑගල යන ආදායම් දිස්ත්‍රික්ක, පුත්තලම් ආදායම් දිස්ත්‍රික්කයේ දෙමළ හත්පත්තුව, වවුනියා ආදායම් දිස්ත්‍රික්කයේ දකුණු වවුනියා (සිංහල) කොටස, මඩකලපු ආදායම් දිස්ත්‍රික්කයේ බින්තැන්න පත්තුව හා වැවගම් පත්තුව.

"සී" ප්‍රදේශය—යාපනය, මන්නාරම සහ ත්‍රිකුණාමලය යන ආදායම් දිස්ත්‍රික්ක, දෙමළ හත්පත්තුව හැර පුත්තලම ආදායම් දිස්ත්‍රික්කය, දකුණු වවුනියා සිංහල කොටස හැර වවුනියා ආදායම් දිස්ත්‍රික්කය හා බින්තැන්න සහ වැවගම් පත්තු හැර මඩකලපු දිස්ත්‍රික්කයේ ඉතිරි කොටස හා හලාවත දිස්ත්‍රික්කයේ උඩප්පු ගම් ප්‍රදේශය.

ඒ ඒ ප්‍රදේශයන්හි පදිංචි බව සහතික කිරීමේ ආකෘති පත්‍රය :—

..................................................මහතා ලංකාවේ පුරවැසියකු බවත්, ඔහු 1960 ජූනි මස 10 වැනි දිනට ප්‍රථම අවුරුදු 3 කට අඩු නොවූ කාලයක්..........................................පදිංචිව සිටි බවත් සහතික කරමි.

................................,
ආදායම් පාලක නිලධාරි/සමාදාන විනිශ්චයකරු/අධිනීතිඥ/නීතිඥ/ප්‍රසිද්ධ නොතාරිස්.

---

# අතුරු ව්‍යවස්ථා

## ගම්සභා ආඥාපනත

ඇල්.ජී.ඩී.—ජීසී. 14/41.

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ කම්මල් පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිත එකී වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පළාත් පලාන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 මැයි මස 20 දින,
කොළඹ, පළාත් පාලන කාර්යාලයේදීය.

### අතුරු ව්‍යවස්ථාව

කම්මල් පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1959යේ අප්‍රේල් මස 27 වැනි දින අංක 10,922 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද අප්‍රසන්නවූ හා අන්තරාදායක වූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ (6) වැනි කාරණයේ "කොටුව" යන වචනය අස්කොට, ඒ වෙනුවට "කොටුව හෝ වල" යන වචන යෙදීමෙන් මෙයින් සංශෝධනය කර සිටිනු ලැබේ.

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ

## අම්බලන්ගොඩ නගර සභාව

### 1959 වර්ෂයේ ලැබීම් සහ ගෙවීම් පිළිබඳ වාර්තාවයි

| ලැබීම් : | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| (ඒ) සාමාන්‍ය ... ... ... | | 1,89,980 38 |
| (බී) මංමාවත් ... ... ... | | 6,933 0 |
| (සී) තානායම් සහ අම්බලම් ... ... | | 4,171 08 |
| (ඩී) නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | | 4,109 89 |
| (ඊ) මහජන සෞඛ්‍යය ... ... | | 28,800 75 |
| (ඇෆ්) මහජන ක්‍රීඩා ... ... | | 23,248 75 |
| (ජී) සොහොන් බිම් ... ... | | — |
| (එච්) සුනඛයින් ලියාපදිංචි කිරීම ... ... | | 19 50 |
| (අයි) තරාදි පඩි සහ සේරු ... ... | | — |
| (ජේ) විදුලි දෙපාර්තමේන්තුව ... ... | | 2,43,747 63 |
| (ඇම්) කියවීම් ශාලා ... ... | | 3,000 0 |
| මුළු ගණන ... | | 5,04,010 98 |
| අඩු කළා ආදයමෙන් ආපසු ගෙවූ මුදල ... | | 190 0 |
| සම්පූර්ණ ආදයම ... | | 5,03,820 98 |
| **වෙනත් ලැබීම් :** | | |
| තැන්පත් මුදල් ... ... | 56,575 72 | |
| අත්තිකාරම් මුදල් ... ... | 17,209 19 | |
| ධීවර නිවාස ආධාර මුදලට ... | 28 0 | |
| ක්‍රීඩා භූමි ආධාර මුදල් ... ... | 4,000 0 | |
| වැඩිපුර ගෙවූ මුදල් ... ... | 2 50 | |
| ආදයමෙන් ආපසු ගෙවූ මුදල් ... | 190 0 | |
| විදුලිය වටිනාකම අඩුවීමට ... | 1,000 0 | |
| සම්පූර්ණ වෙනත් ලැබීම් | | 79,005 41 |
| 1958 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂව ... ... | | 1,57,758 62 |
| එකතුව ... | | 7,40,585 01 |

| ගෙවීම් : | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| (ඒ) සාමාන්‍ය වැය ... ... | | 56,581 52 |
| (බී) මංමාවත් ... ... ... | | 82,599 72 |
| (සී) තානායම් සහ අම්බලම් ... ... | | 6,777 0 |
| (ඩී) නගර සභා ඉඩම් ... ... | | 8,561 0 |
| (ඊ) මහජන සෞඛ්‍යය ... ... | | 1,11,108 76 |
| (ඇෆ්) මහජන ක්‍රීඩා ... ... | | 12,164 61 |
| (ජී) සොහොන් බිම් ... ... | | — |
| (එච්) සුනඛයින් ලියාපදිංචි කිරීම ... | | 544 85 |
| (අයි) තරාදි පඩි සහ සේරු ... ... | | — |
| (ජේ) විදුලි දෙපාර්තමේන්තුව ... ... | | 1,94,749 64 |
| (ඇම්) කියවීම් ශාලා හා පුස්තකාල ... | | 2,320 20 |
| මුළු ගණන ... | | 4,75,407 30 |
| අඩු කළා වැඩිපුර ගෙවූ මුදල් ... | | 2 50 |
| සම්පූර්ණ වියදම ... | | 4,75,404 80 |
| **වෙනත් ගෙවීම් :** | | |
| තැන්පත් මුදල් ... ... | 47,180 83 | |
| අත්තිකාරම් මුදල් ... ... | 18,334 32 | |
| ආධාර මුදල් III නිවාස ක්‍රමයට ... | 197 0 | |
| ස්ථාවර තැන්පත් මුදල් ... | 5,023 11 | |
| තැන්පත් ක්‍රීඩා භූමි වලට ... | 2,833 24 | |
| ලංකා සේවින්ස් බැන්කුවේ ඉතිරි කිරීම... | 206 12 | |
| ණය මුදල් මාර්ග සංවර්ධනයට ... | 2,843 0 | |
| ආදයමෙන් ආපසු ගෙවූ මුදල ... | 190 0 | |
| තානායමට ආධාර මුදල් ... | 2,610 07 | |
| ධීවර නිවාස ක්‍රමයට ආධාර මුදල් ... | 47,564 38 | |
| වැඩිපුර ගෙවූ මුදල් ... ... | 2 50 | |
| සම්පූර්ණ වෙනත් ගෙවීම් ... | | 1,26,984 57 |
| 1959 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂව ... | | 1,38,195 64 |
| ... | | 7,40,585 01 |

අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති, පවුවක විතාන විල්ෆ්‍රඩ් ද සිල්වා වන මම ඉහත කී වාර්තාව මාගේ උසස්ම දැනීමේ හා විශ්වාසයේ හැටියට අම්බලන්ගොඩ නගර සභාව වෙනුවෙන් 1959 වර්ෂය තුළ ලබන ලද හා ගෙවන ලද සියළුම මුදල් පිළිබඳ සැබෑ හා නිවැරදි වාර්තාවක් බවට මෙයින් සහතික කරමි.

පී. ඩබ්ලිව්. විල්ෆ්‍රඩ් ද සිල්වා,
සභාපති.

1960ක්වූ ජනවාරි මස 30 වෙනි දින අම්බලන්ගොඩ නගර ශාලාවේදීය.

ඉහත කී වාර්තාව නිවැරදි බවට සහතික කරමි.

සෑම් රණසූරිය,
සභික.

1960ක්වූ ජනවාරි මස 30 වෙනි දින අම්බලන්ගොඩ දී මා ඉදිරිපිට සහතික කරන ලදී.

ඇස්. වී. සීලා ද සිල්වා (මහත්මිය),
සමාදන විනිශ්චයකාර.

### 1959 ක්වූ දෙසැම්බර් මස 31 වෙනි දින වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තාවයි

| බැරකම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| තැන්පත් මුදල් ... ... ... | | 64,219 85 |
| අගය අඩුවීම පිළිබඳ ගණන—විදුලි අංශය ... | | 5,220 36 |
| පාරවල් පිළිබඳ ණය මුදල ... ... | | 1,555 61 |
| නිවාස ක්‍රමය III වෙනි කොටස සඳහා ආධාර මුදල් ... | | 77,535 30 |
| පුස්තකාලයට ආධාර මුදල් ... ... | | 5,193 84 |
| තානායමට ආධාර මුදල් ... ... | | 0 39 |
| ක්‍රීඩා භූමියට ආධාර මුදල් ... ... | | 11,166 76 |
| ධීවර කාර්මික නිවාසවලට ආධාර මුදල් ... | | 40,349 12 |
| 1959 වර්ෂයේ අය ... ... | 5,03,820 98 | |
| 1959 වර්ෂයේ වැය ... ... | 4,75,404 80 | |
| 1959 වර්ෂයේ අධිකය ... ... | 28,416 18 | |
| 1958 වර්ෂයේ අධිකය ... ... | 11,935 69 | 40,351 87 |
| එකතුව ... | | 2,45,593 10 |

| වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අත්තිකාරම් මුදල් ... ... ... | | | 47,005 49 |
| නිවාස ක්‍රමය II සඳහා අත්තිකාරම් ... ... | | | 1,392 18 |
| ස්ථාවර තැන්පත් මුදල් ... ... ... | | | 56,030 43 |
| ලංකා බැන්කුව, ගාල්ල—ඉතිරි කිරීමේ ගණනය ... | | | 1,103 59 |
| තැපැල් කාර්යාලයීය ඉතිරි කිරීමේ බැන්කුව ... | | | 648 18 |
| ලංකා සේවිංස් බැන්කුවේ ඉතිරි කිරීමේ ගණනය ... | | | 384 87 |
| ලංකා සේවිංස් බැන්කුවේ නිලධාරීන්ගේ ආරක්ෂිත ගණනය | | | 832 72 |
| අතේ ඉතිරි ... ... | | 4,420 25 | |
| සුළු මුදල් ... ... ... | | 250 00 | |
| ලංකා බැන්කුව, කොළඹ—ඉතිරි ... | 34,401 15 | | |
| මුදල් නොගෙවූ චෙක්පත් ... | 13,661 69 | | |
| | | 20,739 46 | |
| මුදල් නොලැබුණු චෙක්පත් ... ... | | 14,171 19 | |
| ආණ්ඩු බද්ද–පොතට නොගිය ... | | 13 33 | |
| ලංකා බැන්කුව, ගාල්ල–ඉතිරි ... | 60,676 98 | | |
| මුදල් නොගෙවූ චෙක්පත් ... | 6,374 00 | | |
| | | 54,302 98 | |
| ආණ්ඩු බද්ද ... ... | | 0 27 | |
| මර්කන්ටයිල් බැන්කුව, ගාල්ල–ඉතිරි | 45,798 18 | | |
| මුදල් නොගෙවූ චෙක්පත් ... | 1,517 17 | 44,281 01 | |
| ආණ්ඩු බද්ද ... ... | | 17 15 | 1,38,195 64 |
| එකතුව ... | | | 2,45,593 10 |

අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති, පටුවත විතාන විල්ෆ්‍රඩ් ද සිල්වා වන මම ඉහත කී වාර්තාව මගේ උපරිම දැනීමේ හා විශ්වාසයේ හැටියට සැබෑ හා නිවැරදි එකක් බවට මෙයින් සහතික කරමි.

පී. ඩබ්ලිව්. විල්ෆ්‍රඩ් ද සිල්වා,
සභාපති.

1960 ක්වූ ජනවාරි මස 30 වන දින අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයයේ දී ය.

1960 ක්වූ ජනවාරි මස 30 වෙනි දින අම්බලන්ගොඩ දී මා ඉදිරිපිට සහතික කරන ලදී.

ඉහත කී වාර්තාව නිවැරදි බවට සහතික කරමි.

සෑම් රණසූරිය,
සහික.

ඇස්. වී. සීලා ද සිල්වා (මහත්මිය)
සමාදාන විනිශ්චයකාර.

අම්බලන්ගොඩ නගර සභාවේ 1959යේ ගණන් හිලවු, එහි සභාපති තුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාරයෙන්, මාගේ විධානය යටතේ පරීක්ෂා කරනු ලැබිණ.

2. වියහියදම් දැරීම පිණිස අනුගමනය කර ඇති පිළිවෙල දෝෂ සහිත බැවින්, ගණන් පරීක්ෂාවේදී සම්මත නොවුණු වියදම් පහත සඳහන් වේ. එකී වියදම් මෙම වර්ෂය තුළදී දරා ඇති මුළු වියදමට ඇතුළත් ය :—

| | රු. ශ. |
|---|---|
| (අ) විදුලිය පිළිබඳ බඩුබාහිරාදිය මිළයට ගැනීම ... ... ... | 4,777 00 |
| (ආ) කොන්ත්‍රාත් සඳහා ගෙවීම් ... ... ... ... | 18,504 90 |

අක්‍රමික ගෙවීම් ආපසු අයකර ගැනීමට හෝ නැතහොත්, ගණන් පරීක්ෂාවේදී එම ගෙවීම් සම්මත කළ හැකිවනු පිණිස ගරු ආමාත්‍යතුමාගේ අනුමතිය ලබාගැනීමට හෝ සභාපතිතුමාට ඉඩ ප්‍රස්ථාව සලසා දී තිබේ.

3. අත්තිකාරම් මුදල් යයි පෙන්වා ඇති රු. 47,005.49 යේ මුදල, ප්‍රධාන ලැජරයේ එම ශීර්ෂය යටතේ දක්වෙන රු. 48,379·59 යේ මුදලටත්, නගර සභාව විසින් මා වෙත ඉදිරිපත් කර ඇති ගෙවන ලද අත්තිකාරම් මුදල් වෙන් වෙන් වශයෙන් සඳහන් ලැයිස්තුවේ දක්වෙන රු. 47,254·15 වේ මුදලටත් වෙනස් ය. මේ වෙනස්කම් පිළිබඳ ගණන් සමකර බැලීමක් තවමත් කර නැත.

4. තැන්පත් ලැජරයේ ගිණුම් ශේෂයන් උපුටාගෙන එය නොගෙවා ඉතිරිව ඇති තැන්පත් මුදල් වශයෙන් මෙහි දක්වෙන රු. 64,219.85 හේ මුදල සමග ගණන් සමකර නො තිබුණු හෙයින්, එම මුදලෙහි හරි වැරදි බැලීමට නුපුළුවන් විය.

5. " වෙනත් ලැබීම් " යටතේ ගණන් පෙන්විය යුතුව තිබුණු පහත සඳහන් ආධාර මුදල් සභාවේ ආදයම් ලෙස වරදවා ගණන් තබා තිබේ :—

| | රු. ශ. |
|---|---|
| (අ) මහජන පුස්ථකාලය සඳහා ආධාර මුදල ... ... ... | 3,000 00 |
| (ආ) නම්බිමුල්ල රවුම් පාර සඳහා ආධාර මුදල ... ... ... | 3,373 00 |

6. ඉහත සඳහන් දෝෂ නිසා හා 1960.4.19 දින දී සභාවේ ලේකම් මහතා අතට දෙන ලද සාකච්ඡා සභාවේ සටහන්වල පෙන්වා ඇති අඩු ලුහුඬුකම් නිසාත් අම්බලන්ගොඩ නගර සභාවේ 1959 ගිණුම් ප්‍රකාශය සත්‍යවූත්, සාධාරණවූත් ප්‍රකාශයක් ලෙස පිළිගත නොහැකි බව මගේ අදහසයි.

ඇල්. ඒ. වීරසිංහ,
ඔඩිටර් ජනරාල්.

ගණන් පරීක්ෂක කාර්යාලය,
කොළඹ 7, 1960 මැයි 30 දින.

---

# විවිධ දැන්වීම්

## උඩඩියන්කුලම කෝරලේ ගම්කායණී සභාව

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය එහි දක්වෙන ස්ථානයේ 1960 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට බල පත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන අනුරාධපුර දිස්ත්‍රික්කයේ උඩඩියන්කුලම කෝරලේ ගම්කායණී සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

උපලේඛණය

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | ස්ථානය | වෙළඳම |
|---|---|---|---|
| ඒ. සරිබදීන් | කටුකැලියාව, අළුත්ගම | ගලෙන්බිඳුනුවැව | එලහරක් මස් |

මෙයට,

ටී. බී. රාජපක්ෂ,
උඩඩියන්කුලම කෝරලේ ප්‍රධාන තැන.

ගම්කායණී සභා කාර්යාලය,
කයිනාට්ටම,
ගලෙන්බිඳුනවැව,
31. 5. 60.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.